**03-02-2024 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබලා ස්වදර්ශන චක්‍රධාරී වේවා. ඔබලා ආලෝක කුළුණු විය යුතුයි. තමන් ජීව බව සලකන්න. මේ සම්බන්ධයෙන් නොසැලකිලිමත් වන්න එපා.

**ප්‍රශ්නය:** ඔබලා ඉතාමත් අරුම පුදුම ශිෂ්‍යයින් වන්නේ කෙසේද ?

**පිළිතුර:** ඔබ තමන්ගේ පවුලේ අයත් සමග නිවසේ ජීවත් වෙමින් ජීවිකාව සඳහා පැය අටක් පුරා වැඩ රාජකාරි කළත් ඒත් සමඟ තම අනාගත උපත් 21කට උපයා ගැනීම සඳහාත් ඔබ පැය අටක් පුරා අන් අයව පරම පියා හා සම කරවීමේ සේවයත් කරනවා. මේ සියල්ල කරනා අතර ඔබ තම නිවහනත් පරම පියාවත් සිහියේ තබාගෙන සිටිනවා. මෙන්න මේක තමයි ඔබගේ අරුම පුදුම ශිෂ්‍ය ජීවිතය. ඥානය හරිම පහසුයි, පාරිශුද්ධ වීමට උත්සාහ දැරීම පමණයි කිරීමට තිබෙන්නේ.

ඕම් ශාන්ති. පරම පියා ඔය සැම දරුවෙකුටම කියනවා ඔබලා දරනා උත්සාහයේ තරමට අශාරීරික ලෝකයත් සිහි කිරීමට ඔබලා උත්සාහ දැරිය යුතුයි. තමන් මුලින්ම සිටියේ ශාන්ත දේශයේ බවත් පසුව සතුටු දේශයට පැමිණි බවත් ඔය දරුවන් සිහිකරනවා ඇති. ඔබලා මෙය අභ්‍යන්තරයෙන් අවබෝධය කරගෙන ඇති. අශාරීරික ලෝකයේ සිට තමන් පහළට පැමිණි මොහොතේ පටන් මෙම ලෝක චක්‍රය කැරකෙන්නේ කෙසේද යන්නත් ඔබගේ සිහියේ තිබෙනවා. මේ කාලයේදී අපි බ්‍රහ්මින්වරුන්. පසුව, දේවතාවරුන්, ක්ෂත්‍රියයන්, වෙළඳුන් හා ශුද්‍රයින් වෙනවා. මෙම චක්‍රය ඔබගේ බුද්ධියේ බ්‍රමණය විය යුතුයි. මෙම මුළු ඥාන සම්භාරය ඔය දරුවන්ගේ සිහියේ තිබෙනවා. පරම පියා ඔබට මෙය පහදා දෙනවා. මීට පෙර ඔබ මේ ගැන දැන සිටියේ නැහැ. දැන් තමයි මේ ගැන දන්නේ. දවසින් දවස ඔබගේ ගණන වැඩි වර්ධනය වේවි. ඔබ තවත් බොහෝ පිරිසකට දිගටම උගන්වාවි. අනිවාර්යෙන්ම ඔබලා ස්වදර්ශන චක්‍රධාරීන් වේවි. ඔබලා මෙහි සිටිනා අතර, ඔහු තමයි තමන්ගේ පරම පියා බව ඔබලා බුද්ධියෙන් දකිනවා. ඔහු අපට උගන්වනා පරම ගුරුවරයාත් වෙනවා. උපත් 84ක් වටා අප යන්නේ කෙසේද යන්නත් ඔහු අපට පැහැදිලි කර කියා දෙනවා. ඔබගේ බුද්ධියේ අනිවාර්යෙන්ම මෙය සිහි තබා ගත යුතුය. මෙය ලොකු පාඩමක් නොවෙයි. එය එක් තත්පරයක පාඩමක්. තමන් කොතැනක වාසය කරන්නන්ද, තමන්ගේ චරිත රඟ දැක්වීම සඳහා ඔබලා මෙහි පැමිණියේ කෙසේද යන කරුණු කාරනා ඔබගේ සිහියට ඇතළු වෙනවා. මෙය උපත් 84ක චක්‍රයකි. ස්වර්ණිම යුගයේ උපත් මෙපමණ ගණනක් ගන්නවා. රිදී යුගයේදී මෙපමණ ප්‍රමාණයක් ගන්නවා. මෙම චක්‍රය ඔබට මතකයි නේද ? තම තමන් ලද නිළතල හා රඟපෑ චරිත කොටස් ඔබට අනිවාර්යෙන් මතක ඇති. ද්විත්ව කිරුළු පලන් ඔබලා පසුව තනි කිරුළක් ඇති අය ලෙස සිටිනා බව ඔබලා කියාවි. තම මුළු අධිරාජ්‍යයම අහිමි කරගෙන ඔබලා තමෝප්‍රධාන් වුණා. මෙම චක්‍රය කැරකැවිය යුතුයි. මෙන්න මේ නිසා තමයි ඔබලා ස්වදර්ශන චක්‍රධාරීන් කියා කියන්නේ. ජීවයට ඥානය ලැබී තිබෙනවා. ජීවය දර්ශනයක් ලබා තිබෙනවා. මේ ආකාරයෙන් චක්‍රය වටා ගිහින් දැන් තමන් නිවහන බලා යා යුතු බව ජීවය දන්නවා. පරම පියා කියා තිබෙනවා මා සිහි කරන්න, ඔබ ඔබගේ නිවහනට යාවි. දැන්ම තමන් ඒ තත්ත්වයට පැමිණිලයි කියා කියන්න බැහැ. බාහිර දේවල් රැසක් ඔබගේ සිහියට ඇතුළු වෙනවා. එක් පිරිසක් එක් දෙයක් සිහිකරනා අතර තවත් පිරිසක් තවත් දෙයක් සිහිකරනවා. මෙහිදී පරම පියා කියන්නේ අන් සැම දෙයක්ම යටපත් කරගෙන පියා පමණක් සිහිකරන්න. තමන්ට ලැබී ඇති ශ්‍රීමත් පිළිපැදිය යුතුයි. ස්වදර්ශන චක්‍රධාරී වී අවසානය දක්වාම උත්සාහ දැරිය යුතුය. මීට පෙර ඔබ කිසිම දෙයක් දැනගෙන සිටියේ නැහැ. දැන් පරම පියා ඔබට කියනවා. ඔහුව සිහි කිරීමෙන් ඔබට සියල්ල දැන ගත හැකි වේවි. නිර්මාණකරුත් නිර්මාණයේ මුල, මැද හා අග පිළිබඳවත් සියලු රහස් ඔබගේ සිහියේ තිබෙනවා. ඔබට මෙම පාඩම් උගන්වා තිබෙනවා. ඔබට ඔහුව නිවසේදීත් සිහි කළ හැකිය. මෙය බුද්ධියෙන් අවබෝධ කර ගත යුතු කරුණක්. ඔබලා අරුම පුදුම ශිෂ්‍යයින්. පරම පියා පහදා දෙනවා ඔබට පැය අටක් විවේකය ගෙන තවත් පැය අටක් තම ජීවිකාව සඳහා වැඩරාජකාරී කළ හැකියි. ඒ ව්‍යාපාරයත් ඔබ කළ යුතුයි. ඒ සමඟම පරම පියා විසින් ඔබට දී ඇති අන් අයවත් ඔබ හා සම කිරීමේ කාර්යයත් ඔබගේ ජීවිකාව සඳහායි. ඒ දේ තාවකාලික කාලයකට වන අතර මෙම ජීවිකාව උපත් 21ක ශාරීරික පැවැත්ම සඳහායි. ඔබ විසින් රඟ දක්වනා චරිත අතුරින් මෙහිත් විශාල වැදගත්කමක් තිබෙනවා. කෙනෙක් කෙතරම් හොඳ උත්සාහයක් දරනවාද ඒ තරමට ඔහුව පසුව භක්ති මාර්ගයේදී වන්දනාවට ලක් වේවි. ඔය දරුවන් මේ සියල්ලම හොඳින් ධාරණය කර ගත යුතුයි. ඔය දරුවන් නළුවන්. බාබා කරන්නේ

ඥානය දීමේ චරිතය රඟදැක්වීම පමණයි. කෙසේවෙතත්, තමන්ගේ ශාරිරික ජීවිකාව සඳහා ඔබ වෙහෙස විය යුතුයි. බාබා ඒක කරන්නේ නැහැ. මෙම ලෝක ඉතාහිසය හා භූගෝලය නැවතත් ක්‍රියාත්මක වන්නේ කෙසේද කියා පරම පියා ඔබට පහදා දෙනවා. ඔහු පැමිණෙන්නේ පැහැදිලි කිරිමට පමණයි. ඔහු දිගින් දිගටම උපක්‍රමශීලිව පහදා දෙනවා. පරම පියා කියනවා දරුවනි, වැරදි කරන්න එපා. ස්වදර්ශන චක්‍රධාරින් හා ආලෝක කුළුණු වෙන්න. තමන් ජීව බව සලකන්න. ශරිරයකින් තොරව ජීවයකට තම චරිතය රඟ දැක්විය නොහැකි බව ඔබලා දන්නවා. මිනිස්සු කිසිම දෙයක් දන්නේ නැහැ. මෙයා හොඳයි කියා ඔවුන් ඔබට කීව්වත් ස්වදර්ශන චක්‍රධාරින් වීමට ඔවුනට බැහැ. ඔබ මෙය හොඳින් මෙහිදී පුහුණු කර සිටිය යුතුයි. එවිට ඔබ කොහේ ගියත් ඥාන සාගරයක් සේ වේවි. ශිෂ්‍යයින් ඉගෙනගෙන පසුව ගුරුවරුන් වී පාසල්වල ඉගැන්වීමට හෝ ව්‍යාපාර කටයුතුවල නිරත වීමට යනවා වගෙයි. ඔබගේ රාජකාරිය ගුරුවරයෙක් වීමයි. සෑම කෙනෙක්ම ස්වදර්ශන චක්‍රධාරි කෙනෙක් කරවන්න. ඔටුණු දෙකක් පැළඳි රජවරුන් තනි ඔටුන්නේ අය බවට පත්වුයේ කෙසේද කියා පෙන්වන පින්තූර දරුවන් සාදා තිබෙනවා. කෙසේවෙතත්, කිරුළු දෙකක් ඔටුන්නට තිබුණේ කවදා සිට කවදා වෙනකම්ද ? තනි කිරුළේ අය බවට පත්වුයේ කවදා සිට කවදා වෙනකම්ද ? පසුව ඔවුන්ගේ රාජ්‍යය පැහැර ගත්තේ කවදාද ? කෙසේද ? ඒ දවස් ලියා දැක්විය යුතුයි. මෙය අසීමිත නාටකයක්. ඔබලා නැවත වතාවක් දේවතාවරුන් වන බව සහතිකයි. දැන් ඔබලා බ්‍රහමින්වරුන්. සංගම යුගයට අයිති වන්නේ බ්‍රහමින්වරුන් පමණයි. මෙය කියා දෙන තෙක් කිසිම කෙනෙක් මේ ගැන දන්නේ නැහැ. මේ ඔබගේ අලෞකික උපතයි. ලෞකික හා පාරලෞකික අයගෙන් ඔබ උරුමයක් ලබනවා. අලෞකික අයගෙන් ඔබට උරුමය ලබා ගැනීමට බැහැ. මොහු හරහා ඔබට උරුමය දෙන්නේ පරම පියායි. අහෝ ප්‍රභූ! කියා කියනවා. අහෝ ප්‍රජාපිතා බ්‍රහ්මා! කියා කවදාවත් කියන්නේ නැහැ. ඔබ ඔබගේ ලෞකික පියාත් පාරලෞකික පියාත් සිහිකරනවා. වෙන කිසිම කෙනෙක් මේ දේවල් දන්නේ නැහැ. ඔබ මේවා දන්නවා. පාරලෞකික පියාගෙන් ඔබ අවිනාශි උරුමයක් ලබනා අතර ලෞකික පියාගෙන් විනාශවන සුළු උරුමයක් ලබනවා. කෙනෙක් රජ කෙනෙකුගේ දරුවෙක් වී මිලියන 5ක උරුමයක් ලබාවී. කෙසේවෙතත්, අසීමිත පියාගෙන් ඔබ ලද උරුමය ඒ හා සැසඳුවහොත් මෙම උරුමය අවිනාශි වන අතර අනෙක කවදා හෝ අවසන් වි යාවි කියා ඔබ කියාවි. අද දවසේ කෝටිපතියකුගේ ඇඟේ මායා එල්ලෙනවා, ඔවුන් මෙහි එන්නේ නැහැ. පරම පියා දුප්පතුන්ගේ ස්වාමියායි. භාරතය ඉතාමත් දුප්පත්. භාරතයේ සිටිනා බොහෝ දෙනා දුප්පත්. ඔබ දැන් විශාල පිරිසකට යහපත සැලසීමට සුදානම් වෙනවා. සාමාන්‍යයෙන් අසනීපයෙන් සිටිනා අය සිටින්නේ කලකිරිමෙන්. ජිවිතෙන් වැඩක් නැහැ කියා ඔවුන් සිතනවා. නිවනට යා හැකි මඟක් සොයා ගනිමු කියා ඔවුන් වේදනාවෙන් මිදීමට මෝක්ෂය පතනවා. සත් යුගයේදි ඔවුන් කිසිවක් අසන්නේ නැහැ. මන්ද, එහි කිසිම දුකක් නැහැ. මේ දේවල් ඔබට දැන් තේරෙනවා. බාබාගේ දරුවන් ගණන වැඩි වර්ධනය වේවි. සූර්ය හා චන්ද්‍ර වාංශික දේවතාවරුන් වීමට සිටිනා අය පමණයි මෙම ඥානය, ඔවුන් විසිනුත් දරනා උත්සාහයේ තරමට ලබා ගන්නේ. පරම පියා හැරෙන්නට වෙන කිසිම කෙනෙක්ට මෙම ඥානය දෙන්න බැහැ. ඔබ දැන් අසීමිත පියා අතහැර වෙන කොහේවත් යන්නේ නැහැ. පරම පියාට ආදරය කරනා අයට මෙම ඥානය ඉතාමත් පහසු එකක් බව අවබෝධ කර ගත හැකියි. නමුත් මායා ඔබට බාධා කරන්නේ පාරිශුද්ධත්වයට පත් වීමටයි. කුමන හෝ කරුණක් සම්බන්ධයෙන් ඔබ වැරැද්දක් කළහොත් ඒ වැරදි නිසා ඔබ පරාජයට පත්වෙනවා. බොක්සින් ක්‍රීඩාව මෙහිදි පෙන්වීමට ඇති හොඳම සංසන්දනයක්. එහිදී දෙදෙනාම එකිනෙකාට පහර දීමට උත්සාහ දරනවා. මායා තමාව පරාජය කරවනා බව ඔය දරුවන් දන්නවා. පරම පියා කියනවා සුමිහිරි දරුවනි, තමන් ජීව බව සලකන්න. මේ සඳහා උත්සාහයක් අවශ්‍ය බව පියාටමත් තේරෙනවා. පරම පියා ඔබට පහසු මඟක් පෙන්වා දෙනවා. මම ජීවයක්. මම මෙම ශරිරය අතහැර දමා මගේ චරිතය රඟ දැක්වීම සඳහා වෙනත් ශරිරයක් ගන්නවා. තමන් අසීමිත පියාගේ දරුවන් බව ඔබලා ස්ථිරවම දැන ගත යුතුයි. මායා ඔබගේ බුද්ධියේ යෝගාව බිඳවන බව බාබාට දැනෙනවා. එක් එක් ආකාරයෙන් අධිරාජ්‍යය නිර්මාණය වන්නේ ඒ පදනම මතයි. සෑම කෙනෙක්ම එක වගේ වුණා නම් අධිරාජ්‍යය නිර්මාණය වන්නේ නැහැ. රජවරුන්, රැජිණියන්, ධනවතුන් හා පුරවැසියන් ආදී සියලු දෙනාම අවශ්‍යයි. ඔබ හැරෙන්න වෙන කිසිම කෙනෙක් මේ දේවල් ගැන දන්නේ නැහැ. අපි අපේම රාජ්‍යය ස්ථාපනය කරනවා. ඔබ අතරිනුත් සුවිශේෂ ආදරණීය අයට පමණයි මෙම මතකය තිබෙන්නේ. මේ දේවල් කවදාවත් අමතක නොකළ යුතුයි. තමන් මේවා අමතක කරනා බව ඔය දරුවන් දන්නවා. නැතිනම්, තමන් ලෝක පාලකයින් වෙනවා කියා ඔබ තුළ විශාල සතුටක් ඇති වේවි. ඔබට ඒ තත්ත්වයට පත්විය හැක්කේ උත්සාහ දැරීමෙන් පමණයි. ඒ ගැන කතා කර කර සිටියාට බැහැ. බාබා මෙහි පැමිණි සැනකින්ම ඔහු කියන්නේ දරුවනි, ප්‍රවේසම් වන්න! ඔබලා මෙහි අසුන්ගෙන සිටින්නේ ස්වදර්ශන චක්‍රධාරින් ලෙසින්ද ? ස්වදර්ශන චක්‍රධාරි කෙනෙක් වන පියාත් මොහුට ඇතුළු වෙනවා. විශ්නුත්

ස්වදර්ශනචක්‍රධාරී කෙනෙක් කියා මිනිස්සු සිතනවා. ඔහු (විෂ්ණු) ලක්ෂ්මී හා නාරායන් බව ඔවුන් දන්නේ නැහැ. ලක්ෂ්මී සහ නාරායන් තත්ත්වය ලබා ගැනීමට ඔවුන්ට ඥානය දුන්නේ කවුද ? ස්වදර්ශන චක්‍රයකින් ක්‍රිෂ්ණා යක්ෂයින්ව ඝාතනය කළ ආකාරය පෙන්වනවා. එවැනි පින්තූර සෑදූ අය ගැන ඔබ පුදුම වෙනවා. එකට එක්වූ පවුල් ආශ්‍රමයක සංකේතය විශ්ණුයි. රූපය හොඳයි, නමුත් ඒක නිවැරදිම නැහැ. මීට පෙර ඔබ මේ දේවල් ගැන දැනගෙන සිටියේ නැහැ. අත් හතරක් ඇති කෙනෙක් මෙහි එන්නේ කෙසේද ? ඔබත් මේ දේවල් ගැන එක් එක් මට්ටමින් දන්නවා. පරම පියා කියනවා සියල්ල රඳා පවතින්නේ ඔබ දරනා උත්සාහයේ තරමටයි. ඔබගේ පාප දුරු වන්නේ පරම පියා සිහි කිරීමෙනුයි. මෙම උත්සාහය අංක එකේ උපරිමය විය යුතුයි. පරම පියා ඔබට කාලය දී තිබෙනවා. ඔබ තම පවුලේ අයත් සමඟ නිවසේ ජීවත් විය යුතුයි. නැතිනම්, ඔබගේ දරුවන් රැක බලා ගන්නේ කවුද ? ඒ සියල්ලම කරමින් තමයි ඔබ මෙය පුහුණු කළ යුත්තේ. කෙසේවෙතත්, වෙනත් කිසිම දෙයක් නැහැ. ස්වදර්ශන චක්‍රයකින් ක්‍රිෂ්ණා අකාසුර්, බකාසුර් යක්ෂයින්ව ඝාතනය කළ ආකාරය පෙන්නුම් කර තිබෙනවා. එවන් චක්‍රයක් ගැන ප්‍රශ්නයක් නැති බව ඔබලා දැන් දන්නවා. ලොකු වෙනසක් තිබෙනවා. මෙය පහදා දෙන්නේ පරම පියා පමණයි. මිනිසුන්ට බැහැ මිනිසුන්ට පහදා දෙන්න. මිනිසුන්ට මුක්තිය දානය කරන්න මිනිසුන්ට බැහැ. නිර්මාණකරු ගැනවත් නිර්මාණයේ මුල, මැද හා අග ගැනවත් කියා දෙන්න ඒ කිසිම කෙනෙක්ට බැහැ. ස්වදර්ශන චක්‍රය යන්නෙහි අර්ථය ඔබට පහදා දෙන්නේ පරම පියා පමණයි. එවන් කතාන්දර ගැන ග්‍රන්ථවලත් සඳහන් වී තිබෙනවා. ඒ ගැන අහන්නවත් එපා. ඉතාමත් හිංසාකාරී ක්‍රිෂ්ණා කෙනෙක් තමයි ඔවුන් පෙන්වා තිබෙන්නේ. මෙහිදී ඔබලා හුදෙකලාව ඥාන සාගරය ආවර්ජනය කළ යුතුයි. රාත්‍රියේ ආරක්ෂක සේවා සපයන අයට එය හොඳ වෙලාවක් ඔවුන්ට හොඳින් ස්මරණයේ සිටිය හැකියි. පියාව සිහිකරනා අතර ස්වදර්ශන චක්‍රයත් කරකවන්න. සතුටින් ස්මරණයෙහි යෙදුනහොත් ඒ සතුට නිසා නිදා ගන්නත් බැරි වේවි. ධනය ලද අය ඉතාමත් සතුටින් සිටිනවා ඔවුන් නිදි කිරා වැටෙන්නේ නැහැ. තමන් නොනිමි සුවයක් හා නොනිමි ධනයක් ලබනා බව ඔබලා දන්නවා. ඉතින් එමනිසා, ඔබලා ඉතාමත් හොඳින් මෙහි නිරත විය යුතුය. නාටකයට අනුව සිදුවන සෑම දෙයක්ම යහපත් බව පරම පියා දන්නවා. ඔහු තව දුරටත් ඔබට උත්සාහ දැරීමට උනන්දු කරවනවා. පරම පියා දැන් ඔබට උගන්වනවා. ඥානයවත් යෝගාවවත් නැති අය රාශියක් සිටිනවා. බුද්ධිමත් හෝ උගත් පුද්ගයෙක් පැමිණියහොත් ඔවුන් හා කතා කිරීමට ඒ අයට බැරි වේවි. අන් අයට පැහැදිලි කිරීමට දක්ෂ, හොඳ කවුදැයි කියා සේවයට ලැදි දරුවන් දන්නවා. පැමිණ සිටින්නා බුද්ධිමතෙක් හෝ උගතෙක් වුවත් පැහැදිලි කරන්නා දුබල බව දුටු විට පියාම පැමිණ ඒ පුද්ගලයාව උසස් කරවනවා. ඉතින් තමන්ට ඥානයක් නොතිබුණත්, පරම පියා පැමිණ ඒ පුද්ගලයාට පැහැදිලි කළ බව හරි දරුවන් කියාවි. ඇතැම් අය අහංකාර වෙනවා. තම චරිතයේ කොටසක් ලෙසින් ඔහු පැමිණ උදව් කිරීම නාටකයේ තීරණය වී ඇති දෙයක්. නාටකය අසහායයි. මෙය තේරුම් ගැනීමට පුළුල් හා අසීමිත බුද්ධියක් අවශ්‍යයි. සෑම කෙනෙක්ම ලස්සන ඒ රාජ්‍යය දැන් තමන් විසින් ස්ථාපනය කරමින් සිටිනා බව ඔය දරුවන් දන්නවා. එහි කිසිම අවලස්සන කෙනෙක් නැහැ. පින්තූරයක් සාදා ලියන්න ලස්සන සහ අවලස්සන. උපත් 63ක් තිස්සේ රාග ගින්නේ අසුන්ගෙන සිට ඔබලා හොඳටම අවලස්සන වෙලා! ජීවය ඒ තත්ත්වයට පත්වෙනවා. ලක්ෂ්මී හා නාරායන් රූපයත් අවලස්සනට හදනවා. එලෙස අවලස්සන වන්නේ ජීවය බව ඔවුන්ට තේරෙන්නේ නැහැ. ඔවුන් ස්වර්ණිම යුගයේ පාලකවරුන් ලෙසින් ලස්සනට සිටියා. පසුව රාග ගින්නේ අසුන් ගැනීම නිසා අවලස්සන වෙලා. ජීවය නැවත උපත් ගෙන තමෝප්‍රධාන් වෙනවා. ජීවය අවලස්සන වන නිසා ශරීරයත් අවලස්සන වෙනවා. ඔබට විහිළුවට වගේ ඔවුන්ගෙන් ඇසිය හැකියි ඇයි මේ සමහර පින්තූරවල ලක්ෂ්මී නාරායන්ව ලස්සනටත් තවත් සමහර පින්තූරවල අවලස්සනටත් පෙන්වා තිබෙන්නේ ? එයට හේතුව කුමක්ද ? ඔවුන්ට කිසිම ඥානයක් නැහැ. ලස්සන ක්‍රිෂ්ණ රූපත් අවලස්සන ක්‍රිෂ්ණ රූපත් සාදන්නේ ඇයි ? මේ මොහොත වන විට ඔබ ඒ ගැන දන්නවා. ඔබට දැන් ඥානය නැමැති තෙවැනි ඇස ලැබී තිබෙනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. සතුටින් පිරී සිටීමට නම් හුදෙකලාව අසුන්ගෙන තමාට ලැබී ඇති ඥාන ධනය හොඳින් ආවර්ජනය කරන්න. පාරිශුද්ධ වී සදාකාලයටම ලෙඩරෝග වලින් නිදහස්ව සිටීමට නම් සිහි කිරීමෙම නිරතව

සිටීමට උත්සාහ දරන්න.

2. පරම පියා සේ මාස්ටර් ඥාන සාගරයක් වී සෑම කෙනෙක්වම ස්වදර්ශන චක්‍රධාරිවරයෙක් බවට පත් කරවන්න. ආලෝක කුළුණක් වන්න. තම අනාගත උපත් 21ක ජීවිකාව උපයා ගැනීමට අනිවාර්යෙන්ම ආධ්‍යාත්මික ගුරුවරයෙක් වන්න.

**වරදානය:** ඔබ "මාස්ටර් ඥානපූර්ණ" වී ඔබේ ත්‍රිකාලදර්ශී අවස්ථාව සමඟින් කාලයෙහි පැති තුනම පැහැදිලිව අත්විඳීමට හැකිවේවා.
ත්‍රිකාලදර්ශී අවධියේ ස්ථිරව සිටින අයට තත්පරයක් තුළ කාලයෙහි අංග තුන පැහැදිලිව දැකගත හැකිය. " ඊයේ මම කවුද? අද මම කවුද? මම හෙට කුමක් වනු ඇත්ද? ” එවැනි ආත්මයන් ඉදිරියේ ඒ සියල්ල පැහැදිලිය. ඔබ නගරයක උසම ස්ථානයේ සිටගෙන බිම බැලූ විට, ඔබට මුළු නගරයම දෙස බලා සතුටු විය හැකිය. ඒ ආකාරයෙන්ම සංගම යුගය ද අග්‍රස්ථානය වේ. මෙම ශිඛරය මත සිටගෙන, කාලයෙහි පැති තුනම දෙස බලා, කුල්මත්ව මෙසේ කියන්න: මම දේවත්වයේ සිටියෙමි නැවත වරක් එය බවට පත්වන්නෙමි. මෙය "මාස්ටර් ඥානපූර්ණ" ලෙස හැඳින්වේ.

**පාඨය:** සෑම මොහොතක්ම අවසාන මොහොතයි: මෙම දැනුවත්භාවය සමඟ සැමවිටම සූදානම්ව සිටින්න.

***** ඕම් ශාන්ති *****